# කොරෝනාවෛරසය යනු කුමක්ද?

- කොරෝනාවෛරස යනු සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාවේ සිට, මැදපෙරදිග ශ්වසන සින්ඩ්‍රෝමය (MERS) සහ දරුණු උග්‍ර ශ්වසන සින්ඩ්‍රෝමය (SARs) දක්වා වන විශාල පරාසයකින් යුතු වෛරස පවුලකට අයත් වෛරසයකි.
- අලුත්ම, නැතිනම් නව කොරෝනාවෛරසය nCoV වේ.
- දැනට පවතින අලුත් කොරෝනාවෛරසය 2019-nCoV වේ.



# කොරෝනාවෛරසයේ සාමාන්‍ය රෝග ලක්ෂණ මොනවාද?

- වැඩි වශයෙන් දැකිය හැකි රෝග ලක්ෂණ නම් උණ, කැස්ස, පපුව තදවීම, සහ හුස්ම ගැනීමේ අපහසුතා ය.
- තත්ත්වය බරපතල අවස්ථාවලදී ආසාදනය නිසා නිව්මෝනියාව, දරුණු උග්‍ර ශ්වසන සින්ඩ්‍රෝමය හෝ මරණය පවා ඇති විය හැකිය. රෝග ලක්ෂණ පහළවීමට දින 2-14 දක්වා කාලයක් ගතවේ.


# කොරෝනාවෛරස එන්නේ කොහි සිටද?

- කොරෝනාවෛරස මගින් නොයෙක් වර්ගයේ සතුන් අතර රෝග පතුරුවයි.
- තවම මිනිසුන්ට වැළඳී නොමැති කොරෝනාවෛරස කිහිපයක්ම සතුන් අතර බෝවෙමින් පවතින බවට හඳුනාගෙන ඇත.
- සත්ව වර්ග අතර බෝවෙමින් තිබෙන වෛරසයක් මිනිසාට (මිනිසුන්ට) ද වැළඳුණු විට එය ස්පිල්ඕවර් තත්ත්වයක් (පිරිතිරිය) යැයි හඳුන්වයි.




# එම රෝගයට ගොදුරුවීමෙන් මා වැළකී සිටින්නේ කෙසේද?

- සබන් සහ වතුර යොදා ඔබේ අත් සෝදන්න නැතහොත් මධ්‍යසාර අඩංගු දියරයක් අත්වල ගාන්න.
- කිවිසුමක් පිටකරන විට හෝ කැස්සක් ඇති වූ විට ටිෂූ කඩදාසියකින්, ඇඳුමේ අත කොටසින් ඔබේ කට වසාගන්න,
- නැතිනම් අත වැලමිටෙන් නවා ඔබේ කට වැසෙන සේ ළං කරගන්න.
- සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ වැනි රෝග ලක්ෂණ ඇති කිසිවෙකු අනාරක්ෂිත ලෙස ඇල්ලීමෙන් වළකින්න.
- ඔබට උණ, කැස්ස සහ/හෝ හුස්ම ගැනීමේ අපහසුතාවක් තිබේ නම් වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න.
- පණ ඇති සතුන් වෙළඳාම් කරන පොළවල් වෙත යන්නේ නම්, පණ ඇති සතුන් අනාරක්ෂිත ලෙස හා සෘජුව අතින් ඇල්ලීමෙන් සහ සතුන් ගෑවුණු මතුපිටවල් ඇල්ලීමෙන් වළකින්න.
- ඔබේ ආහාර, විශේෂයෙන්ම මස්මාංශ වර්ග හොඳින් පිසගන්න.
- ඔබට උණ, කැස්ස සහ හුස්ම ගැනීමේ අපහසුතාවක් තිබේ නම් වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න; කරුණාකර ඔබ ආ-ගිය තැන් සහ සම්බන්ධකම් පැවැත්වීම් පිළිබඳ සියලු කරුණු ඉදිරිපපත් කරන්න.




# මීට පිළියම් තිබෙනවාද?

- කොරෝනාවෛරස සඳහා විශේෂ ප්‍රතිකාර මෙතෙක් සොයාගෙන නැති නමුත්, රෝග ලක්ෂණ වලට ප්‍රතිකාර කළ හැකිය.

# 2019-nCoV වැළැක්විය හැකි සහ ඊට ප්‍රතිකාර කළ හැකි ප්‍රතිජීවක (ඇන්ටිබයෝටික්) කිසිවක් තිබෙනවාද?

- නැත, ප්‍රතිජීවක වලට මෙම වෛරස මැඩ පැවැත්විය නොහැක. 2019-nC0V යනු වෛරසයකි. එබැවින් වැළැක්වීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ක්‍රමවේදයක් ලෙසට ප්‍රතිජීවක පාවිච්චි නොකළ යුතුයි.



# 2019-nCoV වැළඳෙන්නේ වයසක අයට පමණද, නැතහොත් තරුණ අයටත් එය වැළඳිය හැකිද?

- සියලු වයස් කාණ්ඩවල පුද්ගලයන්ට වෛරසය බෝවිය හැකියි. වයසක අයට සහ දැනටමත් වෙනත් රෝගවලින් පෙළෙන අයට මෙම වෛරසය පහසුවෙන් බෝවිය හැකි අතර එවිට ඔවුන් බලවත් ලෙස රෝගාතුර විය හැකියි.

# නිවසේ සිටින සුරතල් සතුන් මගින් 2019-nCoV බෝවිය හැකිද?

- බල්ලන් හෝ පූසන් වැනි නිවෙස්වල ජීවත්වන සුරතල් සතුන්ගෙන් වෛරසය බෝවී ඇති බවට මෙතෙක් සාක්ෂි ලැබී නැත. කෙසේ වෙතත්, සුරතල් සතුන් අතගෑමෙන් පසු නිතරම සබන් හා වතුර යොදා දෑත් සේදීම හොඳ ය.

World Health Organization
Sri Lanka